රජයේ නිවේදනයයි

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙහි පහත උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

උපලේඛනය

I වැනි තීරය				II වැනි තීරය
වෙළඳ භාණ්ඩය				විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද
	සං.ව. ශීර්ෂය	සං.ව. සංකේතාංකය	විස්තරය	
1.	03.05	0305.54.10	හාල් මැස්සන්	කි. ග්‍රෑමයට 10.00
2.		0305.59.10	උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක	කි. ග්‍රෑමයට 10.00
3.	09.04	0904.21.10	මිරිස් - වියළි කුඩු නොකළ හෝ නොඇඹරූ	කි. ග්‍රෑමයට 50.00
		0904.22.10	මිරිස් - වියළි කුඩු කළ හෝ ඇඹරූ	කි. ග්‍රෑමයට 75.00
		0904.22.90	අනෙකුත් - කුඩු කළ හෝ ඇඹරූ	කි. ග්‍රෑමයට 75.00
4.	17.01		ඝන තත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස්	
			අනෙකුත් :	
		1701.91	එකතුකරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු:	
		1701.91.10	පොලරිමීටරයේ 99.7^0 ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත	කි.ග්‍රෑමයට රු. 60.00
		1701.91.20	පොලරිමීටරයේ 99.5^0 ට වැඩි හෝ සමාන සහ 99.7^0 ට අඩු සංඛ්‍යාත සහිත	කි.ග්‍රෑමයට රු. 60.00
		1701.99	අනෙකුත් :	
		1701.99.10	පොලරිමීටරයේ 99.7^0 ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත උක් සීනි	කි.ග්‍රෑමයට රු. 60.00
		1701.99.20	පොලරිමීටරයේ 99.5^0 ට වැඩි හෝ සමාන සහ 99.7^0 ට අඩු සංඛ්‍යාත සහිත උක් සීනි	කි.ග්‍රෑමයට රු. 60.00

		1701.99.30	පොලරිමීටරයේ 99.7^0 ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත බීට් සීනි	කි. ග්‍රෑමයට රු. 60/-
		1701.99.40	පොලරිමීටරයේ 99.5^0 ට වැඩි හෝ සමාන සහ 99.7^0 ට අඩු සංඛ්‍යාත සහිත බීට් සීනි	කි. ග්‍රෑමයට රු. 60/-
		1701.99.90	අනෙකුත්	කි. ග්‍රෑමයට රු. 60/-

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ 2025 දෙසැම්බර් මස 31 දිනැති අංක 2469/12 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි දක්වා ඇති හාල් මැස්සන් (සංයෝජිත වාර්ගීකරණ සංකේත අංක 0305.54.10), උම්බලකඩ (සංයෝජිත වාර්ගීකරණ සංකේත අංක 0305.59.10), වියළි මිරිස් (සංයෝජිත වාර්ගීකරණ සංකේත අංක 0904.21.10, 0904.22.10,0904.22.90) සහ සුදු සීනි (සංයෝජිත වාර්ගීකරණ ශීර්ෂ අංක 17.01) මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2026 නොවැම්බර් මස 13 වැනි දින සිට බලාත්මක වන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

3. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ මෙම නියමය, එකී පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව 2026 නොවැම්බර් මස 13 දිනෙන් ආරම්භ වී 2027 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාවක් සඳහා වලංගුව පැවතිය යුතුය.

අනුර කුමාර දිසානායක
මුදල්, ක්‍රමසම්පාදන
සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026 නොවැම්බර් මස 12 වැනි දින
කොළඹ 01
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.